**<u>මේජර් ජෙනරාල් ඩබ්ලිව් ඒ එස් එස් වනසිංහ ආර්එස්පි ඩීඑස්ඩී යුඑස්පි එන්ඩියු</u>**
**<u>මාණ්ඩලික ප්‍රධානි - ශ්‍රී ලංකා යුද්ධ හමුදාව</u>**

ශ්‍රී ලංකා යුද හමුදාවේ 11 වන යුද්ධ හමුදාධිපති, ඒකාබද්ධ මෙහෙයුම් ආඥාපති හා ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයෙකු ලෙස තම රාජකාරිය උසස් මට්ටමින් ඉටු කළ විශ්‍රාමික ජෙනරාල් හැමිල්ටන් වනසිංහ VSV USP ndc ජ්‍යෙෂ්ඨ නිලධාරිගේ පුත්‍රරත්නය වශයෙන් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙත ඇතුළත් වීමට වාසනාව ලැබූ මෙම ජ්‍යෙෂ්ඨ නිලධාරී තුමන්ගේ ගමන්මග පිළිබද කෙටි හැදින්වීමක් ඉදිරිපත් කිරිමට බලාපොරොත්තු වෙමි.

1968 වර්ෂයේ ඔක්තෝබර් 13 වන දින සුප්‍රසිද්ධ හමුදා පවුලක සහෝදරියන් තිදෙනෙකුගෙන් හා සහෝදරයන් එක් අයෙකුගෙන් යුතු පවුලේ හතරවන දරුවා ලෙස සංජය වනසිංහ යන ජ්‍යෙෂ්ඨ නිලධාරි තුමන් උපත ලබා ඇත.

මෙතුමන් ප්‍රාථමික අධ්‍යාපනය කොළඹ ඩී.එස්. සේනානායක විද්‍යාලයෙන්ද, ද්විතීයික අධ්‍යාපනය ගාල්ල රිච්මන්ඩ් විද්‍යාලයෙන් හා කොළඹ ආනන්ද විද්‍යාලයෙන්ද හදාරා ඇති අතර, පාසල් අවධියේදී තම පාසල වෙත විවිධ අංශයන්ගෙන් ගෞරවය ලබාදුන් දීප්තිමත් ශිෂ්‍යයකු විය. එමෙන්ම එතුමන් පාසල් අවධියේදී ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය නායක තනතුරු හොබවා ඇති අතර, මලල ක්‍රිඩාවන් සඳහා ද දස්කම් දක්වා ඇත. තවද, පාසල් ක්‍රිකට් සහ රගර් කණ්ඩායම් නියෝජනය කරන ලද ඉතා දක්ෂ ක්‍රීඩා කෞශල්‍යකට හිමිකම් කියූ සිසුවෙකු විය.

සාර්ථක පාසල් දිවියට සමුදුන් මෙතුමන් තම පියාගේ අඩිපාරේ යමින් රට ජාතිය සුරැකීමේ ඒකායන අධිෂ්ඨානය පෙරදැරිව 1987 මාර්තු මස 16 වන දින ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට කෙඩෙට් නිලධාරියෙකු ලෙස නිත්‍ය පාඨමාලා අංක 27 වෙත බැඳී මූලික යුධ පුහුණුව යුද්ධ හමුදා විද්‍යා පීඨය - දියතලාව වෙතින් හදාරා ඇත.

ශ්‍රී ලංකා යුද්ධ හමුදා ඉතිහාසය මෙන්ම ලෝක යුද්ධ හමුදා ඉතිහාසයටද නව සලකුණක් තබමින් කෙඩෙට් නිලධාරි විසිරයාමේ පෙලපාලියේ ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් සහභාගි වූ ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ හමුදාධිපති වූ තම පියාගේ දෑතින්ම අසිපත ලැබීමට හා නිළ ලාංඡනය පැළඳීමට වාසනාවන්ත විය.

මෙම ජ්‍යෝෂ්ඨ නිලධාරිතුමන් 1988 දෙසැම්බර් 10 වන දින 2 වන ලුතිතන් වරයෙකු ලෙස අධිකාරියට පත්ව ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ කීර්තිමත් රෙජිමේන්තුවක් වන කාලතුවක්කු හමුදාවට ඇතුළත්ව, 4 වන ශ්‍රී ලංකා කාලතුවක්කු රෙජිමේන්තුව වෙත අනුයුක්ත වන ලද අතර, ඒකකය තුළදි,

- ඛණ්ඩ භාර නිලධාරි
- විධායක අධිකාරි
- ඛතරොයි නිලධාරි අණදෙන
- දෙවන අණදෙන නිලධාරි

තනතුරු ත්‍රස්තවාදීන්ට එරෙහි ක්‍රියාන්විත පැවති කාලවකවානුව තුළදී හොබවා ඇත.

මෙම ජ්‍යෝෂ්ඨ නිලධාරිතුමන්ගේ වසර 36 ක යුද හමුදා සේවා කාලය තුළ,

- 26 වන බළසේනාවේ ප්‍රමානි 3 (ක්‍රියාන්විත) හා බළසේනා මේජර් ලෙසත්,
- 515 බළසේනාවේ බළසේනා මේජර් ලෙසත්,
- කොළඹ කලාප 2ක හි කලාප භාර නිලධාරි අණදෙන ලෙසත්,
- 21 වන සේනාංකයේ ප්‍රමානි 1 (සම්බන්ධීකරණ) ලෙසත් තම රාජකාරිය උසස් මට්ටමින් සිදුකර ඇත.

තම පියා විසින් ශ්‍රීලංකා යුධ හමුදාවේ ආරම්භ කරන ලද දියතලාව ප්‍රගුණ වෙඩික්කරු පුහුණු පාසලෙහි විධායක අධිකාරි, ප්‍රධාන උපදේශක සහ සේනාවිධායක වශයෙන් කටයුතු කල අතර, යුධමය කාලවකවානුවේදී සැඟවුණු වෙඩික්කරුවන් වෙත නායකත්වය ලබාදෙමින් නිරන්තරයෙන් සිදුකරන ලද ක්‍රීයාන්විතයන් හිදි ලබාගත් ඉතා සුවිශේෂී සතුරු ඉලක්ක තුළින් ලැබූ විශිෂ්ට ජයග්‍රහණයන් මේ අවස්ථාවේදි සිහිපත් කරන්නේ ඉමහත් ආඩම්බරයෙනි. පසු කාලයෙදි මේජර් ජෙනරාල් සංජය වනසිංහ ජ්‍යෝෂ්ඨ නිලධාරි තුමන්,

- 59 වන පාබල සේනාංකයේ කර්නල් ප්‍රධාන මාණ්ඩලික වශයෙන්ද
- 682 සහ 144 පාබල බළසේනාවන්හි බළසේනාධිපති වශයෙන්ද
- කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ ශික්ෂණ රෝහලේ, රෝහල් අධ්‍යක්ෂ වශයෙන්ද
- විදේශ මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂ වශයෙන්ද
- 61 වන සේනාංකයේ සේනාංකාධිපති වශයෙන්ද
- යුද්ධ හමුදාවේ විධායක ජෙනරාල් වශයෙන්ද
- ස්වේච්ඡා බලසේනාවේ සේනාවිධායක වශයෙනුත්
- අවසන් වශයෙන් ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ 40 වන නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධාන තනතුරෙහි රාජකාරී කිරීමෙන් අනතුරුව යුද්ධ හමුදා 62 වන මාණ්ඩලික ප්‍රධාන ලෙස පත්වීම් ලබා ඇත.

ඉහත තනතුරු වලට අමතරව යුද්ධ හමුදා ඔරු පැදීමේ සංචිතයේ සහ යුද්ධ හමුදා ක්‍රිකට් කමිටුවේ සභාපති ධූරය හොබවනු ලබන අතර, ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ අභිමානවත් රෙජිමේන්තුවක් වන කාලතුවක්කු රෙජිමේන්තුවේ 22 වන කර්නල් සේනාවිධායක වශයෙන්ද කටයුතු කරනු ලබයි. එමෙන්ම

ශ්‍රීලංකා යුධ හමුදාවෙන් බිහිවූ දක්ෂ වෙඩික්කරුවෙකු වන මෙතුමන්

- 1990 වර්ෂයේ පොයින්ට් 22 රයිෆල් වෙඩිතැබීමේ **තරගාවලියේ** යුද්ධ හමුදා වර්ණ ලබා ගැනීම.
- 1991 වර්ෂයේදී වසර 13 කට පසු ජනාධිපති තුමන් අතින් සංග්‍රාමික වෙඩි තැබීමේ **තරගාවලියක** පදක්කම් ලබා ගත් ප්‍රථම යුද හමුදා නිලධාරියා වීම.
- 1991 වසරේ ශ්‍රී ලංකාවේ පැවති සාර්ක් **තරගාවලිය** සඳහා ශ්‍රී ලංකා රයිෆල් වෙඩි තැබීමේ කණ්ඩායම නියෝජනය කිරීම හා ශ්‍රී ලංකා වර්ණ ලබා ගැනීම.
- ශ්‍රී ලංකා රයිෆල් වෙඩිතැබීමේ කණ්ඩායමේ කළමණාකරු හා චීනය, සිංගප්පූරුව හා ජර්මනියේ පැවැති **තරගාවලි** සඳහා සහභාගිවීම.

- 1994 වර්ෂයේ පවත්වන ලද අන්තර් රෙජිමේන්තු වෙඩිතැබීම් ශූරතාවලියේදී කපිතන් කාණ්ඩයේ පළමු ස්ථානයද, විවෘත කාණ්ඩයේ සිව්වන ස්ථානයද ලබාගැනීම.
- 1997 වර්ෂයේ යුද්ධ හමුදා ක්‍රීඩා පාලක මණ්ඩලය විසින් සංවිධානය කරන ලද යුද්ධ හමුදා වර්ණ ප්‍රදානයේදී වෙඩිතැබීම් වෙනුවෙන් යුද්ධ හමුදා වර්ණ දෙවරක් හිමිකරගත් හමුදා නිලධාරියා වීම.
- 2009 වර්ෂයේ ක්‍රෝඒෂියාවේ දී පැවැති ලෝක සන්නද්ධ හමුදා **තරඟාවලියේ** රයිෆල් වෙඩි තැබීමේ **තරඟ** සඳහා **තරඟකරු**වෙකු වශයෙන් ද, එම **තරඟ** ඉසව් සඳහා සහභාගි වූ **තරඟ** කණ්ඩායමේ පුහුණුකරු වශයෙන්ද මෙතුමා සහභාගි වී ඇති අතර,
- ශ්‍රී ලංකා ජාතික රයිෆල් සංගමයේ ලේකම් ලෙසත් ජාතික ක්‍රීඩා වෙඩිතැබීමේ සංගමයේ ලේකම් ලෙසත් කටයුතු කර ඇති අතර, මෙම සංගම් දෙකේම ලේකම් තනතුරු හෙබවූ ප්‍රථම හමුදා නිලධාරියා වීම හා.........,

බංගලාදේශ යුද්ධ හමුදාව, ප්‍රගුණ වෙඩික්කරු පුහුණු පාසලක් ආරම්භ කිරීම සඳහා උපදෙස් හා මගපෙන්වීම් මෙම ජ්‍යෙෂ්ඨ නිලධාරිතුමන් වෙතින් ලබා ගන්නා ලද අතර, එය එතුමන්ට හා යුද්ධ හමුදාවටත් විශාල ගෞරවයක් විය.

මෙම ජ්‍යෙෂ්ඨ නිලධාරිතුමන් තම හමුදා ජීවිතය **තුළ**

- එක්සත් රාජධානිය
- පාකිස්ථානය
- ඉන්දියාව
- තුර්කිය
- ක්‍රෝයේෂියාව සහ චීනය යන රටවල් හි පාඨමාලා හා පුහුණු වැඩමුළු සඳහා සහභාගි වී ඇති අතර, **එම හදාරන ලද පාඨමාලා කිහිපයක් නම්**

- යුධ අභ්‍යාස පාඨමාලාව - එක්සත් රාජකීය හමුදා විද්‍යාපීඨය (Sandhurst)

- කාලතුවක්කු තරුණ නිලධාරි පාඨමාලාව - පාකිස්ථානය
- නිලධාරි ශාරීරික අභ්‍යාස පාඨමාලාව - ඉන්දියාව
- කාල තුවක්කු උසස් පාඨමාලාව - පාකිස්ථානය
- කාලතුවක්කු අණදෙන්නන්ගේ පාඨමාලාව - චීනය
- සාමසාධක රාජකාරි තුලදී අවි ගැටුම් අවම කිරීමේ පාඨමාලාව - තුර්කිය
- ආරක්ෂක හා ක්‍රමෝපාය පිළිබඳව පාඨමාලාව ජාතික ආරක්ෂක විශ්ව විද්‍යාලය (ndu) - චීනය
- මීට අමතරව ශ්‍රී ලංකා යුද්ධ හමුදා ප්‍රගුණ වෙඩික්කරු පුහුණු පාසලේ මූලික ප්‍රගුණ වෙඩික්කරු පාඨමාලාව, උසස් ප්‍රගුණ වෙඩික්කරු පාඨමාලාව, පුහුණු උපදේශක පාඨමාලාව සහ යුද හමුදාව තුළ පවත්වන්නාවූ ඉතා දුෂ්කර පාඨමාලාවක් වන දීර්ඝ කාලීන **සැඟවුණු** වෙඩික්කරු පාඨමාලාව හදාරා ඇත.

මෙතුමන් වර්තමාන නිලයට උසස්වීම් ලැබීමේදී තම පියාණන් භාවිතා කළ අසිපත තම පියාණන්ගේ අතින්ම ලබා ගැනීමට තරම් වාසනාවන්ත විය. තවද, මෙම ජ්‍යෙෂ්ඨ නිලධාරිතුමන් යුද බිමේදී දැක්වූ රණකාමීත්වය අගයනු වස් රණශූර පදක්කමෙන්ද, තම ආදරණීය පියාණන්ට මෙන්ම මෙතුමන්ගේද අග්‍රගණ්‍ය හමුදා සේවාව හා නිකැලැල් හමුදා සේවය අගයමින් විශිෂ්ට සේවා විභූෂණය හා උත්තම සේවා පදක්කමෙන්ද පිදුම් ලබා ඇති අතර, ඊට අමතරව

- නැගෙනහිර මානුෂීය මෙහෙයුම් පදක්කම
- උතුරු මානුෂීය මෙහෙයුම් පදක්කම
- පූර්ණ භූමි පදක්කම
- උතුරු නැගෙනහිර මෙහෙයුම් පදක්කම
- රිවිරැස ක්‍රියාන්විත පදක්කම
- 50 වන නිදහස් දින සංවත්සර පදක්කම
- යුද්ධ හමුදා 50 වන සංවත්සර පදක්කම
- 75 වන නිදහස් දින සංවත්සර පදක්කම
- දීර්ඝ සේවා පදක්කම

- සේවාභිමානී පදක්කම
- සේවා පදක්කම

යන පදක්කම් වලින්ද පිදුම් ලබා ඇත.